**අම්බලන්තොට ප්‍රාදේශීය සභාව**
**හම්බන්තොට දිස්ත්‍රික්කය**

---

**1 මූල්‍ය ප්‍රකාශන**

**1.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම**

සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන 2014 අප්‍රේල් 01 දිනද , ඉකුත් වර්ෂයට අදාල මූල්‍ය ප්‍රකාශන 2013මාර්තු 28 දිනද විගණනයට ඉදිරිපත් කර තිබූ අතර සමාලෝචිත වර්ෂයේ විගණකාධිපතිවරයාගේ වාර්තාව 2014 දෙසැම්බර් 3 දින සභාවේ සභාපතිවරයාට යවා ඇත.

**1.2 තත්ත්වාගණනය කළ මතය**

මෙම වාර්තාවේ 1.3 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර , මූල්‍ය ප්‍රකාශන වලින් 2013 දෙසැම්බර් 31 දිනට අම්බලන්තොට ප්‍රාදේශීය සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරිත්වය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්ම වලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිඹිබු කරන බව මා දරන්නා වූ මතය වේ.

**1.3 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම**

**1.3.1 ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිති වලට අනුකූල නොවීම**

පහත කරුණු නිරීක්ෂණය කරනු ලැබේ.

(අ) 2010 ජනවාරි 19 දිනැති අංක PED/54 දරන රාජ්‍ය ව්‍යාපාර අධ්‍යක්ෂ ජනරාල්වරයාගේ චක්‍රලේඛය අනුව 2011 ජනවාරි 01 දින සිට පළාත් පාලන ආයතන විසින්ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිති වලට අනුව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කළයුතු වුවත් එම ප්‍රමිති අනුගමනය කර නොතිබුණි.

(ආ) සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන සමඟ මුදල් ප්‍රවාහ ප්‍රකාශනය ඉදිරිපත් කර නොතිබුණි.

**1.3.2 ගිණුම්කරණඅඩුපාඩු**

-----------------------

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) සමාලෝචිත වර්ෂයේ සපයන ලද ගලිබවුසර් සේවාවන් වෙනුවෙන් ලැබිය යුතු රු.81,150 ක් වූ ආදායම්, වර්ෂයේ ආදායමින් හා ආදායම් ණයගැතියන් ගෙන් අත්හැරී තිබුණි. ඉදිරි වර්ෂයේ ගලිබවුසර් සේවාවන් සැපයීම වෙනුවෙන් සමාලෝචිත වර්ෂයේ ලද රු. 8,100 ක් සමාලෝචිත වර්ෂයේ ආදායම් ලෙස ගිණුම්ගත කර තිබුණි.

(ආ) සභාව විසින් වීථි පහන් නඩත්තු වෙනුවෙන් ලංකා විදුලිබල මණ්ඩලයෙන් සමාලෝචිත වර්ෂය අවසානයට ප්‍රතිපූර්ණය විය යුතු මුදල රු.464,496 ක් වුවද, ශේෂ පත්‍රයේ හිඟ හිටි වෙනත් ආදායම් යටතේ එය රු.100,953 ක් ලෙස රු.363,543 ක් අඩුවෙන් දක්වා තිබුණි.

**1.3.3 පැහැදිලි නොකළ වෙනස්කම්**

--------------------------------

සමාලෝචිත වර්ෂයේ ශේෂ පත්‍රයේ සඳහන් අවසන් තොගය හා තොග ලේඛනයන්හි පැවති ශේෂයන් අතර රු. 16,415 ක පැහැදිලි නොකළ වෙනස්කම් නිරීක්ෂණය විය.

**1.3.4 විගණනයසඳහාසාක්ෂිනොවීම**

-----------------------------------

එකතුව රු. 136,987,770 ක් වූ ගනුදෙනු සම්බන්ධව ලේඛන, උපලේඛන , කාලවිශ්ලේෂණ , පිළිබඳ සාක්ෂි විගණනයට ඉදිරිපත් නොකෙරිනි.

**2. මූල්‍යසමාලෝචනය**

----------------------

**2.1 මූල්‍යප්‍රතිඵල**

--------------

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2013 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම රු. 6,458,658 ක් වූ අතර ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම රු. 2,464,900 ක් විය.

## 2.2 ආදායම් පරිපාලනය

### 2.2.1 ආදායම් රැස්කිරීමේ කාර්ය සාධනය

සභාපතිවරයා විසින් සමාලෝචිත වර්ෂයට අදාලව ඉදිරිපත් කර තිබූ ඇස්තමේන්තුගත ආදායම් , තථ්‍ය ආදායම් හා හිඟ ආදායම් පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

| ආදායම් ප්‍රභවය | ඇස්තමේන්තුගත ආදායම | තථ්‍ය ආදායම | දෙසැම්බර් 31 දිනටසමුච්චිත හිඟය |
|---|---|---|---|
| | රු. 000’ | රු. 000’ | රු. 000’ |
| • වරිපනම් හා බදු | 2,013 | 3,580 | 3,718 |
| • බදුකුලී | 14,825 | 14,942 | 913 |
| • බලපත්‍ර ගාස්තු | 2,106 | 2,044 | 428 |
| • වෙනත් ආදායම් | 44,423 | 39,666 | 71,566 |

### 2.2.2 වරිපනම්බදු

සමාලෝචිත වර්ෂය අවසානයට හිඟ වරිපනම් බදු ආදායම රු. 3,717,831 ක්වූ අතර හිඟ වරිපනම් බදු අයකර ගැනීම සඳහා 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභාපනතේ 158 (1) (අ) වගන්තිය ප්‍රකාර කටයුතු කර නොතිබුණි. හිඟශේෂය තුල දීර්ඝ කාලයක සිට ගෙවීම් පැහැරහැර ඇති වරිපනම් බදු ඒකක 24 ක් පවතින බව නිරීක්ෂණය වූ අතර එහි වටිනාකමරු. 813,359 ක් විය.

### 2.2.3 බදුකුලී

සමාලෝචිත වර්ෂය අවසානයට හිඟ කඩකුලී ආදායම රු. 84,790 ක් වූ අතර එම හිඟ කඩකුලී ආදායම් අයකර ගැනිම සඳහා 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 159(1) වගන්තිය ප්‍රකාර කටයුතු කර නොතිබුණි.

### 2.2.4 බලපත්‍රගාස්තු

සමාලෝචිත වර්ෂය අවසානයට හිඟ බලපත්‍ර ගාස්තු ආදායම රු. 427,860 ක් වූ අතර එම හිඟ බලපත්‍ර ගාස්තු ආදායම් අයකර ගැනිම සඳහා 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 152(4) වගන්තිය ප්‍රකාර කටයුතු කර නොතිබුණි.

**2.2.5 වෙනත්ආදායම්**

------------------

**(අ) දැන්වීම් පුවරු ගාස්තු**

---------------------------------

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(i) සභාබල ප්‍රදේශය තුල ගාස්තු අයකළ හැකි දැන්වීම් පුවරු සම්බන්ධයෙන් 2013 වර්ෂය සඳහා සමීක්ෂණයක් කර නොතිබුණි.

(ii) 2012 දෙසැම්බර් 07 දිනැති ගැසට් නිවේදනයේ පරිදි ස්ථිර දැන්වීම් පුවරු සඳහා වර්ග අඩියකට රු. 150 ක මුදලක් අයකළ යුතු වුවත් වර්ග අඩියකට රු. 100 බැගින් පෞද්ගලික සමාගමක දැන්වීම් පුවරු සඳහා ගාස්තු අයකිරීමෙන් රු. 76,850 ක මූල්‍ය පාඩුවක් සභාවට සිදුව තිබුණි.

(iii) සභාව විසින් විශාල වශයෙන් ගාස්තු අයකළ හැකි සන්නිවේදන හා අනෙකුත් සමාගම් වල දැන්විම් පුවරු වලින් ගාස්තු අයකිරිමට ක්‍රියාකර නොතිබුණි.

**(ආ) ගලි බවුසර් ආදායම්**

----------------------

සභාවට අයත් ගලි බවුසරය සේවයේ යෙදවීම වෙනුවෙන් ආයතන තුනකින් වර්ෂය අවසානයට එකතුව රු. 159,600 ක මුදලක් අයවීමට තිබුණි. හිඟමුදල් අයකර ගැනීම සඳහා ප්‍රමාණවත් ක්‍රියාමාර්ග ගෙන නොතිබුණු අතර ඉන් රු. 151,600 ක් 2012 වර්ෂය වෙනුවෙන් ලැබිය යුතු මුදලක් විය.

**(ඇ) හිඟයන්ත්‍රෝපකරණආදායම්**

---------------------------------

සමාලෝචිත වර්ෂය අවසානයට සභාව විසින් කොන්ත්‍රාත්කරුවන්ට හා බාහිර පුද්ගලයන්ට මෝටර් ග්‍රේඩරය , බැකෝලෝඩරය හා වීල්ලෝඩරය සැපයීම වෙනුවෙන් අයවිය යුතු යන්ත්‍රෝපකරණ ආදායම රු. 1,558,090 ක් විය. ඉන් රු. 97,260 ක මුදලක් ඉකුත් වර්ෂයේ යන්ත්‍රෝපකරණ සැපයීම වෙනුවෙන් අයවිය යුතු ශේෂයක් වූ අතර 2013 දෙසැම්බර් 31 දින වනවිටත් මෙම හිඟ අයකර ගැනීමට ප්‍රමාණවත් ක්‍රියාමර්ග ගෙන නොතිබුණි.

**2.2.6 උසාවි දඩ හා මුද්දර ගාස්තු**

2013 දෙසැම්බර් 31 දිනට පළාත් සභාවේ ප්‍රධාන ලේකම්වරයා ගෙන් හා අනෙකුත් බලධාරින් ගෙන් එකතුව රු. 12,667,120 ක උසාවි දඩ හා මුද්දර ගාස්තු අයවිය යුතුව තිබුණි.

**3. මෙහෙයුම් සමාලෝචනය**

**3.1 කාර්ය සාධනය**

2013 වර්ෂයේ දකුණු පළාත් මන්ත්‍රි ප්‍රතිපාදන යටතේ රු. 225,000 ක යෝජිත කර්මාන්ත 03 ක් , මහ නැඟුම ප්‍රතිපාදන යටතේ රු. 2,000,000 ක කර්මාන්ත 04 ක් හා සභා අරමුදලින් යෝජිත රු. 4,035,000 ක කර්මාන්ත 02 ක් සමාලෝචිත වර්ෂය අවසානය වනවිටත් ක්‍රියාත්මක කර නොතිබුණි.

**3.2 කළමනාකරණ අකාර්යක්ෂමතා**

ශ්‍රී ලංකා ජනරජයේ ආයතන සංග්‍රහයේ 1 කාණ්ඩයේ II පරිච්ඡේදයේ 8.1 වගන්තිය ප්‍රකාර පත්වීම් ලිපියක් නොමැතිව සහ ශ්‍රී ලංකා ජනරජයේ මුදල් රෙගුලාසි 201 සඳහන් විධිවිධානයන්ට පටහැනිව 2013 වර්ෂයේ සේවකයන් දෙදෙනෙකු සේවයේ යොදවා ගෙන ජනවාරි සිට ඔක්තෝබර් දක්වා රු. 707,090 ක මුදලක් වැටුප් ලෙස ගෙවා තිබුණි. එම සේවකයන් සඳහා අර්ථසාධක අරමුදල් සඳහා දායක මුදල්අයකර නොතිබුණි. 1994 ජුනි 17 දිනැති අංක 23/94 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛය අනුව වෛද්‍ය වෘත්තීය හැර වයස අවුරුදු 45 ඉක්මවූ පුද්ගලයන් රාජ්‍ය සේවයට බඳවා ගැනීම නොකළ යුතු වුවත් එයට පටහැනිව මෙම සේවකයන් සේවයේ යොදවාගෙන වැටුප් ගෙවා තිබුණි.

**3.3 මෙහෙයුම් අකාර්යක්ෂමතා**

1986 මාර්තු 10 දිනැති අංක 392/9 දරන අති විශේෂ ගැසට් නිවේදනයේ පලකරනු ලැබූ 1986 නාගරික සංවර්ධන අධිකාරිය (සැලසුම් හා ගොඩනැගිලි) නියෝග අංක 07 හි සඳහන් පරිදි සභාව විසින් ඉදිකිරිම් කටයුතු අනුමත කළ ගොඩනැගිලි සැලසුම්170 ක් වෙනුවෙන් ඉදිකිරීමේ කටයුතු නිම කිරීමෙන් පසුව අධීක්ෂණ කටයුතු සිදුකර අනුකූලතා සහතික නිකුත් කිරීමට කටයුතු කර නොතිබුණි.

**3.4 නිෂ්ක්‍රීය වත්කම්**

සභාව අංක 53 – 5712 කැබ් රථය , 49 – 0993 ෆෝඩ් ට්‍රැක්ටරය හා 41 – 6894 ලොරි බවුසරය ප්‍රයෝජනයට නොගෙනදීර්ඝ කාලයක සිට අක්‍රීයව පැවතින. එම වත්කම් 2009 නොවැම්බර් 13 දිනැති අංක 438 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛය ප්‍රකාර අපහරණය කිරීමට කටයුතු කර නොතිබුණි.

**3.5 කොන්ත්‍රාත් පරිපාලනය**

පහත නිරීක්ෂණ කරනු ලැබේ.

**(අ) ඇලේගොඩ නැගෙනහිර බැමිණියන්විල ශ්‍රී සුමන මාවත කොන්ක්‍රීට් කුට්ටිගල් අතුරා සකස් කිරීම**

අනුමත සමිතියක් වෙත මෙම කර්මාන්තය පවරා ඉටුකරවා ගෙන රු. 499,732 ක වැඩ වටිනාකමක් සහිතව බිල්පත් සකස් කර ප්‍රතිපූර්ණය සඳහා යවා තිබුණි.

i. 1.2.4 සිමෙන්ති, වැලි, ගල් මිශ්‍රණයෙන් අඟල් 4 ක් පළලට සහ අඟල් 09 ක් උසට කොනක්‍රීට් ගැටි සැකසීම වෙනුවෙන් දික්මීටර් 170 ක් සඳහා රු. 440 බැගින් රු. 74,800 ක මුදලක් බිල් කර තිබුණ ද මාර්ගයේ ස්ථාන කිහිපයක් 2013 දෙසැම්බර් 13 දින පරීක්ෂා කිරීමේදී කොන්ක්‍රීට් ගැටි වල උස පහත පරිදි විය.

- පළමු ස්ථානය - අඟල් 4
- දෙවන ස්ථානය - අඟල් 4
- තෙවන ස්ථානය - අඟල් 5
- සිව්වන ස්ථානය - අඟල් 4 ½

ii. ඉහත අංක i හි සඳහන් පරිදි මාර්ගයේ දෙපස ඉදිකර තිබූ කොන්ක්‍රීට් ගැටි දෙකෙහි සාමාන්‍ය උස අඟල් 4.4 කට ආසන්න අගයක පවතින බව නිරීක්ෂණය වූ අතර අඟල් 09 ක් සඳහා ගෙවීමට බිල්පත් සකස් කිරීම නිසා රු. 38,231 ක් වැඩිපුර බිල් කිරීම් සිදුකර තිබුණි. හොඳ තත්ත්වයේ බොරළු සපයා උරහිස් සඳහා යොදා සණවත් කිරීම වෙනුවෙන් සණ මීටර් 5.7 ක් සඳහා රු. 4,802 ක මුදලක් ගෙවීමට බිල් කිරීම් සිදුකර තිබුණද මාර්ග උරහිස් සඳහා බොරළු සපයා නොතිබුණි. භෞතික පරීක්ෂාවේදී මෙම මාර්ගය සඳහා බොරළු සැපයීමේ අවශ්‍යතාවයක් නොතිබුනෙන් කාර්මික නිලධාරීන් විසින් නිසි අධීක්ෂණයකින් තොරව බිල්පත් සකස්කර ඇති බවද නිරීක්ෂණය විය.

iii. අහල් 9 ක් උසට ඉදිකල යුතු කොන්ක්‍රීට් ගැටි ඒ අනුව ඉදිනොකිරීම නිසා එම කොන්ක්‍රීට් ගැටිවල ශක්තිමත් භාවය හා කල් පැවැත්ම පිළිබඳ ගැටලුකාරී තත්ත්වයක් පවතින බවද නිරීක්ෂණය විය.

**(ආ) ඇලේගොඩ නැගෙනහිර ශ්‍රී මහීරත්න මාවත කොන්ක්‍රීට් කුට්ටිගල් අතුරා සකස් කිරීම**

---

අනුමත සමිතියක් වෙත මෙම කර්මාන්තය පවරා ඉටුකරවා ගෙන රු. 498,579 ක වැඩ වටිනාකමක් සහිතව බිල්පත් සකස් කර ප්‍රතිපූර්ණය සඳහා යවා තිබුණි.

i. 1.2.4 සිමෙන්ති , වැලි, ගල් මිශ්‍රණයෙන් අහල් 04 ක් පළලට සහ අහල් 09 ක් උසට කොන්ක්‍රීට් ගැටි සැකසීම වෙනුවෙන් දික්මීටර් 144 ක් සඳහා රු. 440 බැගින් රු. 63,360 ක මුදලක් බිල්කර තිබුණද මාර්ගයේ ස්ථාන කිහිපයක් 2013 දෙසැම්බර් 13 දින පරීක්ෂා කිරීමේදී කොන්ක්‍රීට් ගැටිවල උස පහතපරිදිවිය.

- පළමු ස්ථානය - අහල් 3.75
- දෙවන ස්ථානය - අහල් 3.8
- තෙවන ස්ථානය - අහල් 3.5
- සිව්වන ස්ථානය - අහල් 4

ii. ඉහත අංක i හි සඳහන් පරිදි මාර්ගයේ දෙපස ඉදිකර තිබූ කොන්ක්‍රීට් ගැටි දෙකෙහි සාමාන්‍ය උසඅහල් 3.8 ක ට ආසන්න අගයක පවතින බව නිරීක්ෂණය වූ අතර 2013 දෙසැම්බර් 13 දින කරන ලද ක්ෂේත්‍ර පරීක්ෂණයේදි අහල් 09 ක් සඳහා ගෙවීමට බිල්පත් සකස් කිරීම නිසා රු. 36,608 ක් වැඩිපුර බිල්කිරීම් සිදුකර තිබුණි. හොඳ තත්ත්වයේ බොරළු සපයා උරහිස් සඳහා යොදා සණවත් කිරීම වෙනුවෙන් සණමීටර් 4.8 ක් සඳහා රු. 4,044 ක මුදලක් ගෙවීමට බිල් කිරීම සිදුකර තිබුණද මාර්ග උරහිස් සඳහා බොරළු සපයා නොතිබුණි. භෞතික පරීක්ෂාවේදී මෙම මාර්ගය සඳහා බොරළු සැපයීමේ අවශ්‍යතාවයක් නොතිබුණ ද කාර්මික නිලධාරීන් විසින් නිසි අධීක්ෂණයකින් තොරව බිල් පත් සකස් කර ඇති බව රීක්ෂණය විය.

iii. අහල් 9 ක් උසට ඉදිකල යුතු කොන්ක්‍රීට් ගැටි ඒ අනුව ඉදිනොකිරීම නිසා එම කොන්ක්‍රීට් ගැටිවල ශක්තිමත් භාවය හා කල් පැවැත්ම පිළිබඳ ගැටලුකාරී තත්ත්වයක් පවතින බවද නිරීක්ෂණය විය.

**(ඇ) ඇලේගොඩ නැගෙනහිර හරස්වැව මාර්ගය කොන්ක්‍රිට් කුට්ටිගල් අතුරා සකස් කිරිම.**

---

අනුමත සමිතියක් වෙත මෙම කර්මාන්තය පවරා ඉටුකරවාගෙන රු.499,732 ක වැඩ වටිනාකමක් සහිතව බිල්පත් සකස් කර ප්‍රතිපූර්ණය සඳහා යවා තිබුණි.

(i.) 1.2.4 සිමෙන්ති, වැලි, ගල් මිශ්‍රණයෙන් අඟල් 04 ක් පළලට සහ අඟල් 09 ක් උසට කොන්ක්‍රිට් ගැටි සැකසිම වෙනුවෙන් දික් මීටර් 170 ක් සඳහා රු.440 බැගින් රු.74,800 ක මුදලක් බිල්කර තිබුණද මාර්ගයේ ස්ථාන කිහිපයක් පරික්ෂා කිරිමේදි කොන්ක්‍රිට් ගැටි වල උස පහත පරිදි විය.

* පළමු ස්ථානය - අඟල් 5
* දෙවන ස්ථානය - අඟල් 3
* තෙවන ස්ථානය - අඟල් 4
* සිව්වන ස්ථානය - අඟල් 4

(ii.) ඉහත අංක I හි සඳහන් පරිදි මාර්ගයේ දෙපස ඉදිකර තිබූ කොන්ක්‍රිට් ගැටි දෙකෙහි සාමාන්‍ය උස අඟල් 4 කට ආසන්න අගයක පවතින බව 2013 දෙසැම්බර් 13 දින කරන ලද ක්ෂේත්‍ර පරික්ෂාවේදි නිරික්ෂණය වු අතර අඟල් 09 ක් සඳහා ගෙවිමට බිල්පත් සකස් කිරිම නිසා රු.41,555 ක් වැඩිපුර බිල්කිරිම් සිදුකර ඇති බව නිරික්ෂණය විය. හොඳ තත්ත්වයේ බොරළු සපයා උරහිස් සඳහා යොදා සණවත් කිරිම වෙනුවෙන් සණ මීටර් 5.7 ක් සඳහා රු.4,802 ක මුදලක් ගෙවිමට බිල්කිරිම සිදුකර තිබුණ ද මාර්ග උරහිස් සඳහා බොරළු සපයා නොතිබුණි. භෞතික පරික්ෂාවේදි මෙම මාර්ගය සඳහා බොරළු සැපයීමේ අවශ්‍යතාවයක් නොතිබුණි. කාර්මික නිලධාරින් විසින් විසින් නිසි අධික්ෂණයකින් තොරව බිල්පත් සකස් කර ඇති බව නිරික්ෂණය විය.

(iii.) අඟල් 9 ක් උසට ඉදිකල යුතු කොන්ක්‍රිට් ගැටි ඒ අනුව ඉදි නොකිරිම නිසා එම කොන්ක්‍රිට් ගැටිවල ශක්තිමත් භාවය හා කල් පැවැත්ම පිළිබඳ ගැටලුකාරි තත්ත්වයක් පවතින බවද නිරික්ෂණය විය.

**(ඈ) තත්ත්ව පරීක්ෂණ වාර්තා සඳහා වැඩිපුර ගෙවීම් කිරිම**

**-----------------------------------------------------------**

මග නැගුම වැඩසටහන යටතේ කොන්ක්‍රිට් කුට්ටිගල් අතුරා සකසන මාර්ග වල කුට්ටි ගල්තත්ත්ව පරීක්ෂාවේදී 2012 වර්ෂයේ කොන්ක්‍රිට්ගල් 20 ක් පරීක්ෂාව සඳහා රු. 11,000 සිට රු. 12,500 දක්වා පරාසයක මුදලක් ගෙවීම් කර තිබු අතර 2013 වර්ෂයේ කොන්ක්‍රීට් ගල් 09 ත් 10 ත් අතර ප්‍රමාණයක් පරික්ෂාව සඳහා රු. 12,000 ත් රු. 12,500 ත් අතර ප්‍රමාණයක් කර්මාන්ත 26 කට ගෙවීම සඳහා බිල් පත්‍ර සකස් කර තිබු අතර කර්මාන්ත 4 ක් සඳහා රු. 12,500 බැගින් ගෙවීම් කර තිබුණි. පළාත්පාලන දෙපාර්තමේන්තුවේ පරීක්ෂණාගාරය විසින් එක් කොන්ක්‍රීට් ගලක් පරීක්ෂාව සඳහා අයකරන මුදල රු. 600 ක් බව අනාවරණය වු අතර කාර්මික නිලධාරීන් විසින් එක් කොන්ක්‍රීට් ගලක් පරීක්ෂාව සඳහා රු. 1,250 සිට රු. 1,388 ක් දක්වා පරාසයක මුදලක් බිල්පත් වල ඇතුළත් කරතිබුණි. ඒ අනුව වැඩිපුර බිල් කර ඇති මුළු මුදල රු. 195,400 ක් විය.

**(ඉ) මුදල් ප්‍රතිපූර්ණය වීමට ප්‍රථම කර්මාන්ත සඳහා සභා අරමුදලින් ගෙවීම් කිරීම**

**--------------------------------------------------------------------------------**

වරාය හා මහාමාර්ග අමාත්‍යාංශයේ ප්‍රතිපාදන හා පළාත් නිශ්චිත ප්‍රතිපාදන උපයෝගී කරගෙන ක්‍රියාත්මක කර තිබු කර්මාන්ත සඳහා බිල්පත් සකස්කර ප්‍රතිපූර්ණය සඳහා යැවීමෙන් අනතුරුව එම මුදල් ලැබීමට ප්‍රථම කොන්ත්‍රාත්කරුවන් සඳහා රු. 671,582 ක මුදලක් සභා අරමුදලින් ගෙවා තිබුණි. විගණන දිනය වු 2013 දෙසැම්බර් 31 දින වන විට මෙම මුදලින් රු. 271,582 ක මුදලක් ප්‍රතිපුර්ණය වී නොතිබුණි.

**3.6 සභාවේ සභිකයින් සඳහා ඉන්ධන ලබාදීම**

**----------------------------------------------**

සභාවේ සභිකයින් සඳහා බාහිර පාර්ශවයන් ගෙන් යන්ත්‍රෝපකරණ ලබාගෙන සභාබල ප්‍රදේශයේ මාර්ග සංවර්ධන කටයුතු ඉටුකිරීම සඳහා සභා අරමුදලින් ඉන්ධන (ඩීසල්) ලීටර් 4449 ක් මිළදී ගැනීම වෙනුවෙන්රු. 533,510 ක මුදලක් වැයකර තිබුණි. 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 219(1) වගන්තිය ප්‍රකාර යම් ප්‍රාදේශීය සභාවක කිසිම සභිකයෙකුට හෝ සේවකයෙකුට ප්‍රාදේශීය සභාව සමඟ ඇති කරන ලද හෝ ක්‍රියාවේ යොදවන ලද යම් ගිවිසුමක හෝ වැඩයක සම්බන්ධතාවයක් හෝ මුල්‍ය සම්බන්ධතාවයක් කෙලින්ම හෝ අන්‍යාකාරයකින් නොතිබිය යුතු වුවත් එකී විධිවිධානයට පටහැනිව මෙම ඉන්ධන ප්‍රමාණයට අදාල ඇනවුම් සභිකයන් විසින්

අත්සන් කර භාරගැනීම සිදුකර තිබුණි. ඒ ඒ සභිකයන් වෙත ලබාදී තිබූ ඉන්ධන ප්‍රමාණයන් මාර්ග ප්‍රතිසංස්කරණ කටයුතු සඳහා භාවිතා කර ඇති බවට කාර්මික නිලධාරී වාර්තාද නොවීය.

## 4. පද්ධති හා පාලන

-------------------

පහත සඳහන් පද්ධති හා පාලන ක්ෂේත්‍ර කෙරෙහි සභාවේ විශේෂ අවධානය යොමු කරනු ලැබේ.

(අ) ගිණුම්කරණය

(ආ) වත්කම් කළමනාකරණය

(ඇ) ආදායම් පරිපාලනය

(ඈ) මානව සම්පත් කළමනාකරණය

(ඉ) වාහන පරිපාලනය